www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# පකිස්ථානයේ යුද්ධය ජාත්‍යන්තර ආතතීන් අවුලුවයි

## Pakistan war fuels international tensions

**2009 මැයි 11**

ඉස්ලාමාබාදයේ චීන තානාපති පසුගිය මැයි 7 දින, පකිස්ථානය තුල ඔබාමා පරිපාලනය දැඩි කරමින් සිටින මැදිහත්වීමේ වගකීම් විරහිත ස්වභාවය ඉස්මතු කර දැක්වීය. ස්වොට් නිම්නයේ හා යාබද දිස්ත්‍රික්ක තුල ඉස්ලාමීය ත්‍රස්තවාදීන්ට එරෙහිව සෑම අතකින්ම මිලිටරි ප්‍රහාර එල්ල කිරීම සඳහා ඉස්ලමාබාදයට බලකිරීම මඟින් වොෂින්ටනය, පකිස්ථානය අස්ථාවර කරනවා පමනක් නොව තියුනු කැලඹීම් සහිත ප්‍රදේශයේ ආතතිය තව දුරටත් වැඩි දියුනු කරයි.

පකිස්ථානයේ ව්‍යාපාරික ප්‍රධානීන් අමතමින් චීන තානාපති ලුඕ සාහෝසුයි කලාපය තුල වැඩි වී ඇති පිටස්තර "ඇඟිලි ගැසීම්" ගැන එක එල්ලේ ම සිය කනස්සල්ල පල කලේය. ඔහු එක්සත් ජනපදය ගැන විශේෂයෙන් සඳහන් නොකල ද, අසල්වැසි ඇෆ්ගනිස්ථානය තුල එක්සත් ජනපද ප්‍රතිපත්ති හා එරට තුල විශාල සංඛ්‍යාවක් විදේශ හමුදා රැඳී සිටීම කෙරෙහි චීනය නොසතුටට පත්ව සිටින බව කියාසිටියේ ය. "ත්‍රස්තවාදයට එරෙහි සටන" සඳහා චීනයේ සහයෝගය ගැන යලිත් අවධාරනය කරමින් ලුඕ කියා සිටියේ, එක්සත් ජනපද මූලෝපායන්ට යම් "නිවැරදි කිරීමේ පියවර" අවශ්‍ය බවයි. "මේවා චීනයේ දැඩි අවධානයට ලක්ව ඇති ප්‍රශ්න ය."

අසාමාන්‍ය ලෙස විවෘත ලුඕගේ ප්‍රකාශ නිකුත් වූයේ, එක්සත් ජනපද ජනාධිපති ඔබාමා සිය චීන සහකරු වන ජනාධිපති හූ ජින්ටාවෝට කථා කිරීමෙන් දිනකට පසුව ය. එහිදී ප්‍රශ්න ගනනාවක් ගැන සාකච්ඡා කරන අතරතුර, පුලුල් කර තිබෙන පකිස්ථාන යුද්ධය පැහැදිලිව ම න්‍යාය පත්‍රයේ මුලට ම ගෙන තිබුනි. මෙම පුද්ගලයින් දෙදෙනා අතර පලමු ප්‍රසිද්ධියට පත්කල දුරකථන සංවාදය සිදුවූයේ ඇෆ්ගන් හා පකිස්ථාන ජනාධිපති වරුන් සමඟ ඔබාමා එම දෙරටෙහි එක්සත් ජනපද මූලෝපාය පිලිබඳව කථා කරන අතරවාරයේ ය. වාර්තාවූ පරිදි හූ සිය සහයෝගය ප්‍රකාශ කල අතර, ලුඕගේ ප්‍රකාශ වලින් පල වූයේ, දකුනු ආසියාව තුල වර්ධනය වන එක්සත් ජනපද බලපෑම් පිලිබඳව චීනයේ යටින් පවතින බියයි.

ඇෆ්ගනිස්ථානය හා පකිස්ථානය යන දෙරටෙහි ම ඉහල නඟින මිලිටරි ප්‍රචන්ඩත්වය, පසුගිය සතියේ වොෂින්ටනයේ පැවති තුන් පාර්ශවීය සමුලුව තුලින් සංඥා කරයි. එක්සත් ජනපදයේ දැඩි බලපෑම් හමුවේ පකිස්ථානු හමුදාව ස්වොට් නිම්නයේ සටන්කාමීන්ට එරෙහිව මහා පරිමානයේ ප්‍රහාරයක් දියත් කල අතර, දැනටමත් සිය ගනනක් මියගොස් ලක්ෂ සංඛ්‍යාවකට පලායාමට බලකෙරී තිබේ. කෙසේ වුව ද සමුලුවේ සාකච්ඡාවන්ට, මිලිටරි සහයෝගිතාවයට වැඩි දෙයක් අන්තර්ගතව තිබුනි. කලාපයේ ඇමරිකානු බලපෑම් ක්ෂේත්‍රයට දෙරට ආර්ථිකව හා මූලෝපායිකව සමීප ලෙස ඒකාග්‍ර කිරීම සඳහා සවිස්තරාත්මක සැලසුම් එහි දී සාකච්ඡාවට බඳුන් විය.

පකිස්ථානය සමඟ දිගු කාලීන සම්බන්ධතා පවත්වන චීනය, මෙම වර්ධනයන් මඟින් පැහැදිලිව ම නොසංසුන් වී සිටියි. තානාපති ලුඕ ව්‍යාපාරිකයන්ගේ සිය ප්‍රේක්ෂකත්වයට කියා සිටි පරිදි, පකිස්ථානය තුල ව්‍යාපෘතීන් 122 ක චීන සමාගම් 60 කට වැඩි සංඛ්‍යාවක් සම්බන්ධව සිටියි. පකිස්ථානයෙහි සිටින 10,000 කට වැඩි චීන ඉංජිනේරුවන් හා තාක්ෂනික විශේෂඥයින්ගේ ආරක්ෂාව පිලිබඳව පකිස්ථානය සමඟ ''සමීප සහයෝගය'' ගැන ඔහු අවධානය යොමු කර තිබුනි. සැබවින්ම මීට පෙර බීජිනය අවධාරනය කර තිබුනේ, පකිස්ථාන සටන්කරුවන් විසින් චීන පුරවැසියන් පැහැරගෙන යාම හා මරාදැමීම පිලිබඳව ප්‍රති ප්‍රහාර එල්ල කරන බව මෙන්ම, පකිස්ථානය තුල සැඟවී සිටින බටහිර චීනයේ ඉගූර් බෙදුම්වාදීන්ට එරෙහිව මිලිටරි වැටලීම් අවශ්‍ය කෙරෙන බවයි.

අති මූලිකව ගත් කල බීජිනය, සිය කලාපීය මූලෝපායෙහි ලා ඉස්ලාමාබාදය තීරනාත්මක හවුල්කරුවෙකු වශයෙන් සලකනු ලබයි. 1962 චීන-ඉන්දියානු දේශසීමා යුද්ධයෙන් පසු කාලයේ, පකිස්ථානය ඉන්දියාවට ප්‍රති බලයක් ලෙස ගොඩනැගීම සදහා චීනය සැලකිය යුතු සම්පත් ප්‍රමානයක් කැපකර තිබේ. පකිස්ථානය චීනයේ විශාලතම අවි ගැනුම්කරුවා වන අතර, පෙන්ටගන් වාර්තාවකට අනුව 2003-2007 අතර චීනයේ මිලිටරි අපනයන වලින් සියයට 36 ක්ම ගියේ පකිස්ථානයටය. පකිස්ථානයේ න්‍යෂ්ටික අවි හා බැලිස්ටික් මිසයිල් වැඩ පිලිවෙලවල් සදහා චීනයේ තාක්ෂනික සහාය අතිශයින්ම වැදගත්ය.

එයට හිලව් වශයෙන් බලුකිස්ථානයේ වෙරල බඩ නගරයක් වන ග්වාඩාර් හි ප්‍රධාන නාවික හා වානිජ්‍ය වරාය පහසුකම් ගොඩනැගීම සදහා චීනයට අවසර ලැබී ඇත. සියල්ලටමත් වඩා, මැද පෙරදිග හා

අප්‍රිකාවෙන් තෙල් හා ගෑස් සම්පාදනය සුරක්ෂිත කර ගැනීමෙහිලා, ඉන්දීය සාගරය හරහා වැටී ඇති ප්‍රධාන මුහුදු මාර්ග දිගේ ඇති වරායන් ගනනාවක්, චීනයේ ප්‍රසාරනය වන නාවික කටයුතුවල දී පිවිසුම් ස්ථාන ලෙස ස්ථාපනය කර ගැනීමේ, බීජිනයේ ''මුතු මාලය'' යන මූලෝපායේ කඩ ඇනය බවට මෙම වරාය පත්වෙයි. එක්සත් ජනපදය සිය පාර්ශවයෙන් චීනය සලකන්නේ, නැගී එන ආර්ථික හා මූලෝපායික එදිරිවාදියෙක් ලෙස වන අතර, සිය නාවික හා මිලිටරි ආධිපත්‍යයට අභියෝගයක් මතුවීම පිලිබඳව නොරිස්සුම් සහගතව සිටියි.

පකිස්ථානය මුල් කර ගෙන වර්ධනය වන එක්සත් ජනපද-චීන ආතතීන්, ප්‍රථමයෙන් ඇෆ්ගනිස්ථානය යටත් කර ගැනීමත්, දැන් පකිස්ථානය වඩාත් සෘජු ලෙස තම අනසක යටතට ගැනීමට දරන උත්සාහයත්, ඇතුලු වොෂින්ටනයේ ආක්‍රමනික මැදිහත් වීමේ ගැඹුරින්ම අස්ථාවරකාරී භූමිකාව ඉස්මතු කරනවා පමනි. පකිස්ථානයේ පැතිරෙමින් ඇති ගැටුම, එක්සත් ජනපදය මූලිකත්වය ගත් ඇෆ්ගනිස්ථාන ආක්‍රමනයේ සෘජු නිමැවුමකි. බුෂ් පරිපාලනය ඒ සඳහා පකිස්ථානයේ සහාය පෙල ගස්වා ගත්තේ, එරට මිලිටරි ප්‍රහාරයක ඉලක්කයක් බවට පත්විය හැකිය යන තර්ජනය යටතේ ය. එක්සත් ජනපදයේ කටයුතු පිලිබඳව පකිස්ථානය හා ඇෆ්ගනිස්ථානය තුල පවතින පුලුල් විරුද්ධත්වය, ත්‍රස්තවාදයේ වැඩෙන රැල්ලට ඉන්ධන සපයමින්, ඇෆ්ගනිස්ථානයේ එක්සත් ජනපද මිලිටරි අනසක පැතිරවීමට පමනක් නොව, පකිස්ථානයේ පූර්න පරිමාන සිවිල් යුද්ධයක් ඇවිලී යාමට ද තර්ජනය කර සිටියි.

ඔබාමා පාලනාධිකාරය යටතේ එක්සත් ජනපද අධිරාජ්‍යවාදය, පුලුල් කලාපය පුරා, විශේෂයෙන්ම බලශක්තියෙන් පොහොසත් මධ්‍යම ආසියාව තුල, සිය මූලෝපායික ආසක්තයන් පෙරට ගෙනයාමේ අරමුන තුලින් නිර්මානය කල එම ව්‍යසනයන්ම, පෙරලා ගසාකෑමට අදිටන් කර ගෙන සිටියි. එසේ කිරීමේ දී වොෂින්ටනය, අඩමාන මූලෝපායික තුලනය ප්‍රගාඪ ලෙස වෙනස් කිරීමෙන් අනෙකුත් මහා බලවතුන් ද එම සුලිය තුලට ඇද දැමීමේ තර්ජනය මතු කරයි.

මධ්‍යම ආසියාවේ එක්සත් ජනපද සැලසුම් හා ඇෆ්ගනිස්ථානය තුල විශාල විදේශ හමුදා රැඳී සිටීම පිලිබඳව නොසංසුන්ව සිටින්නේ චීනය පමනක්ම නොවේ. 1991 සෝවියට සංගමය බිඳ වැටීමෙන් ඉක්බිත්තෙහි එක්සත් ජනපදය, අලුතින් පිහිටුවන ලද මධ්‍යම ආසියානු සමූහාණ්ඩු සමඟ මිලිටරි සන්ධානයන් අටවා ගැනීමේ ව්‍යායාමයක නිරතව සිටියි. වොෂින්ටනය සිය ඇෆ්ගනිස්ථාන ආක්‍රමනය, මධ්‍යම ආසියාව තුල ප්‍රථම වතාවට මිලිටරි කඳවුරු ගොඩනගා ගැනීම සඳහා උපයෝගීකර ගනියි. ඇෆ්ගනිස්ථානය හා පකිස්ථානය, කලාපය තුලින් පොහොසත් බලශක්තිය ඇද ගැනීම සඳහා විභව විකල්ප නල මාර්ගයක් සපයා ගැනීමට ද ප්‍රයෝජනවත් ය. කලාපය සිය පිලිකන්න ලෙස සලකන චීනය හා රුසියාව යන දෙරට ම, එයට ප්‍රතිචාර දක්වා ඇත්තේ, ඇමරිකානු බලපෑමට වැට බැඳීම සඳහා ෂැංහයි සහයෝගිතා කන්ඩායම තුල එක්ව සිටිමිනි.

අසල්වැසි පකිස්ථානයේ සිදුවීම් දෙස ඉන්දියාව බලා සිටින්නේ ද චකිතයකිනි. "ත්‍රස්තවාදයට" එරෙහිව යුද වැදීමට ඉස්ලාමාබාදය වෙත යොදන වොෂින්ටනයේ පීඩනය පිලිබඳව නිහඬව සතුට භුක්ති විඳින අතරම නවදිල්ලිය, ඇමරිකාවේ කුඩය යටට සමීප ලෙස පකිස්ථානයේ එක්වීම, යන්තම් 1990 ගනන්වල අග භාගයේ වර්ධනය කරගත් එක්සත් ජනපද-ඉන්දීය මූලෝපායික හවුල්කාරත්වය බාල වීමට තුඩුදෙනු ඇතැයි කනස්සල්ලට ද පත්ව සිටියි. ඉන්දියාව පකිස්ථානය සමඟ යුද්ධ තුනකට පැටලැවී ඇති අතර, තම එදිරිවාදියෙකු වන එරට දුබල වීම, නවදිල්ලිය සාදරයෙන් පිලිගනු ඇතැයි යන්න නිසැකය. එනමුදු එය, එක්සත් ජනපද රූකඩ රාජ්‍යයක් මඟින් විස්ථාපනය වීම හෝ ඊටත් වඩා නරක ව්‍යසනයකට එය ඇද වැටීම, ඉන්දීය සංස්ථාපිතය හමුවට ගෙන එනු ඇත්තේ නව අනිශ්චිතභාවයකි.

සමස්ත කලාපයම පවතින්නේ වෙඩිබෙහෙත් හෙප්පුවක විභවය සහිතවය. ලෝකය සෝවියට් හා බටහිර කඳවුර අතර බෙදී ගිය සීතල යුද්ධයේ නියතීන්, නව ආතතීන් හා එදිරිවාදිකම් මඟින් විස්ථාපනය වී ගොසින් ය. ඉන්දියාව හා පකිස්ථානය විසින් ඔවුන්ගේ දිගු කාලීන ආරාවුල්, විශේෂයෙන්ම කාෂ්මීරය සම්බන්ධ, විසඳගැනීමට ගෙන ඇති අඩමාන පියවර සියල්ල ඇනහිට තිබේ. චීනය හා ඉන්දියාව විසින් සබඳතා සවිමත් කර ගැනීමට දරන උත්සාහය පෙරට යන්නේ මන්දගාමීව ය. එකෙක් අනෙකා දෙස බලන්නේ සැකයෙනි. එසේ ම එකිනෙකාගේ වියදමෙන් නේපාලය, ශ්‍රී ලංකාව හා බුරුමය තුල කුමන්ත්‍රනවල යෙදී සිටිති.

මෙම බිඳෙන සුලු සංයුතියෙහි අතිශය පුපුරන සුලු අන්තර්ගතය වන්නේ, එක්සත් ජනපද අධිරාජ්‍යවාදය විසින් සිය දිගු කාලීන ආර්ථික පරිහානියේ අඩුව පියවා ගැනීමට, තම මිලිටරි අධිකාරය යොදාගැනීමයි. ආතතීන් සමහන් කිරීම කෙසේ වෙතත් ඔබාමා පාලනාධිකාරය ස්ථාපනය කිරීමෙන් සලකුනු කරන්නේ, එක්සත් ජනපද අභිමතයන් පෙරට දමාගැනීමේ අරමුනෙන්, ඇෆ්ගනිස්ථාන හා පකිස්ථාන යුද්ධයේ නව ආක්‍රමනශීලී හැරීමකි. චීන තානාපති විසින් පසුගිය සතියේ කරන ලද ප්‍රකාශ, වොෂින්ටනයේ නූල් සූත්තර නිදැල්ලේ නොයනු ඇතැයි යන්න පිලිබඳ තවත් ඇඟවීමකි.

පීටර් සිමන්ඩ්ස්

© www.wsws.org